## කිතුනු ගී

### 289 – මහිමේ උස් මණ්ඩලේ

මහිමේ උස් මණ්ඩලේ සුරිඳුන්හට අයත්වේ
සුදනන් හට මිහිපිටේ සන්හිඳීම අයත් වේ

අපි ඔබ පසසන්නමෝ ඔබේ ගුණ ගයන්නමෝ
අපි ඔබ නමදින්නමෝ මහිම තෙද වනන්නමෝ

ඔබේ මහ මහිමය සදා අපි පින් දෙමු ඔබ පුදා
අහෝ සුර රදාණනේ සකල බලැති දෙවිඳුනේ

අහෝ ජේසු සමිඳුනේ දිනු එක් සුතාණනේ
දේව බැටළුවාණනේ පිය සඳුන් සුතාණනේ

ලෝ පව් හරුවාණනේ අපට දයා වුව මැනේ
ලෝ පව් හරුවාණනේ යැදුම'ප පිළි ගනු මනේ

පිය දකුණෑ හිඳින්නනේ අපට දයා වුව මනේ
ඔබම හේළිවන නිසා ඔබම සමිඳු වන නිසා

ජේසු කිතුනි ඔබමැ හා හේලි සුදත් සුරුඳු හා
දෙව් සුරුපිය සඳුන් හා මහිමයෙන් උතුම් ම හා

ඒ එසේමැ වේ.